කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022
2025 සැප්තැම්බර්/ ඔක්තෝබර්

සමාජීය විද්‍යා පීඨය

පුස්තකාල හා විඥාපන විද්‍යාව
(අධ්‍යයන වර්ෂ 2009 සිට 2016 දක්වා)

පුස්තකාල, ඒවායේ සේවා, එකතු සංවර්ධනය හා කළමනාකරණය
**LISC – E1025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි. කාලය : පැය 03 යි.

---

01. දේශීය ඥානය ආරක්ෂා කරලීමේ කාර්යයේ දී වාචික සාම්ප්‍රදාය ප්‍රධාන භූමිකාවක් ඉටු කර ඇත. වාචික සාම්ප්‍රදාය ආරක්ෂා කරලීමේ කාර්යයේ දී මහජන පුස්තකාල සතු වගකීම් පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

02. විශේෂ පුස්තකාලයක විශේෂ ලක්ෂණයක් වන්නේ පර්යේෂණ උදෙසා තොරතුරු සේවා ක්‍රියාත්මක කිරීමයි. විවිධ තොරතුරු සේවා පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීමක් කරමින් මේ ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 20)

03. මෙරට මහජන පුස්තකාල පද්ධතියට ග්‍රන්ථ ප්‍රතිග්‍රහනය කරගැනීමේ ක්‍රියාවලියේ දී මුහුණ දීමට සිදුවන අභියෝග හා ඒවා විසඳා ගැනීමට ඔබගේ යෝජනා පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 20)

04. පුස්තකාල සහයෝගීතාවයන් පුස්තකාල ක්ෂේත්‍රයට අවශ්‍යවීමට බලපා ඇති හේතු පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 20)

05. පුස්තකාලයක එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් යනු කුමක්දැයි හඳුන්වා එවන් ප්‍රතිපත්තියක් තුළින් පුස්තකාලයකට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

06. විධිමත් පුස්තකාල සේවාවක් පවත්වාගෙන යාම උදෙසා ප්‍රමිති තුළින් ලැබෙන සහාය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

07. පහත සඳහන් මාතෘකා අතරින් හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනත
ii. වෙළෙඳ ග්‍රන්ථ නාමාවලිය
iii. පුස්තකාල පොත් අපහරණය
iv. පරිග්‍රහන ලේඛනය
v. වාරණය (ලකුණු 05x4=20)

******************************